## කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 3. බයිසිකලයක් පැදීම

මෙම කොවිඩ්-19 වසංගතය අතරතුර, බයිසිකලය ඉතා උචිත ප්‍රවාහන ක්‍රමයක් ලෙස නිර්දේශ කළ හැකිය. පවුලේ සාමාජිකයෙක් හැර වෙනත් පුද්ගලයන් පාපැදියේ රැගෙන යාමෙන් වලකින්න.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

පාපැදිකරු

- බයිසිකල් පදින්නන් අන් අය සමඟ හමුවීමට මුහුණ දෙන්නේ නම් මුහුණු ආවරණයක් පැළඳිය යුතුය.
- බයිසිකල් මංතීරුව ඇත්නම්, එය භාවිතා කිරීම සැමවිටම හොඳය.
- ගමන අවසන් වූ පසු පාපැදිකරු ඔහුගේ / ඇයගේ අත් සබන් ගා හොඳින් සේදීම කල යුතුය.
- හැකි නම්, පාපැදිකරු ඔහු / ඇය සමඟ සාක්කුවේ අත් සනීපාරක්ෂක බෝතලයක් රැගෙන යා යුතුය.
- රෝගී තත්වයක් දැනෙන්නේ නම් ගමන් කිරීමෙන් වළකින්න (උණ, කැස්ස සහ සීතල).
- ඔබට නිල හැඳුනුම්පතක් තිබේ නම්, එය පොලිස් නිලධාරීන්ට පැහැදිලිව පෙනෙන සේ පළඳින්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- ජනමාධ්‍ය / සමාජ මාධ්‍ය හරහා දැනුම් දිය යුතුය.
- මුහුණු ආවරණයක් පැළඳිය යුතුය.
- පැමිණීමෙන් පසු අත් සෝදන්න.




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.